# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2334/21 - 2023 මැයි මස 31 වැනි බදාදා - 2023.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**

102 වන වගන්තිය යටතේ වන නිවේදනය

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ (මෙහි මින්මතු "දේශීය ආදායම් පනත" යනුවෙන් හඳුන්වනු ලබන) 102 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ ද කැමැත්ත ඇතිව ඉහත කී 102 වන වගන්තිය යටතේ මෙම නිවේදනයට පෙර ලියාපදිංචි වී ඇති තැනැත්තන් හැර මෙහි උපලේඛනයේ අ - කොටසෙහි හෝ ආ - කොටසෙහි සඳහන් වෘත්තික තැනැත්තන් දේශීය ආදායම් පනතේ 102 වන වගන්තිය යටතේ ලියාපදිංචි විය යුතු අතිරේක තැනැත්තන් පන්ති ලෙසට නිශ්චිතව සඳහන් කරමින් මෙම නිවේදනය ප්‍රකාශයට පත් කරන ලදී.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 ක් වූ මැයි මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

**අ - කොටස**

2023 ජූනි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි;

(i) වෛද්‍ය ආඥාපනත (105 වන පරිච්ඡේදය) යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති වෘත්තිකයන්
(ii) 1959 අංක 23 දරන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයින්


1A - PG 6335 — 456 (2023/05)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(iii) 2009 අංක 23 දරන පනත යටතේ සංස්ථාපිත ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයින්

(iv) 1968 අංක 17 දරන පනත යටතේ සංස්ථාපිත ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයින්

(v) ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ සාමාජිකයින්

(vi) 1976 අංක 01 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය පනත යටතේ සංස්ථාපිත ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ සාමාජිකයින්

(vii) 2007 අංක 20 දරන පනත යටතේ සංස්ථාපිත ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනයේ සාමාජිකයින්

(viii) ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරුන්

(ix) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිය ව්‍යාපාර ලියාපදිංචි කර ඇති තැනැත්තන්

(x) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි වාහන ලියාපදිංචි කර ඇති (ත්‍රී රෝද රථ, යතුරු පැදි සහ අත් ට්‍රැක්ටර් හැර) වාහන හිමිකරුවන්

(xi) 2018 අප්‍රේල් 01 වැනි දින හෝ ඊට පසු ශ්‍රී ලංකාවේ ඕනෑම නිශ්චල දේපළක් මිලදී ගත් හෝ පැවරුම් ඔප්පුවක් යටතේ අත්පත් කරගත් තැනැත්තන්

(xii) ඕනෑම සේවක අර්ථ සාධක අරමුදලක් සඳහා සේවා දායකයාගේ සහ සේවා යෝජකයා යන දෙපාර්ශවයේම මාසික දායකත්වයෙහි එකතුව රුපියල් 20,000/- ඉක්මවන සේවකයින්

(xiii) පළාත් පාලන ආයතනයකින් ගොඩනැගිලි සැලැස්මක් සඳහා අනුමැතිය ලබා ගන්නා ඕනෑම පුද්ගලයෙක්

(xiv) ශ්‍රී ලංකාවේ දී ඕනෑම සේවාවක් සැපයීම තුලින් මසකට රුපියල් 100,000/- ක් හෝ මාස දොළහක් සඳහා රුපියල් 1,200,000/- කට වඩා ගෙවීමක් ලබන වෙනත් ඕනෑම පුද්ගලයෙක්

**ආ - කොටස**

2024 ජනවාරි මස 01 සිට බලපැවැත්වෙන පරිදි, ඉහත අ කොටසෙහි කිසිදු කාණ්ඩයකට අයත් නොවන ඕනෑම පුද්ගලයෙක් සහ ;

(i) 2023 දෙසැම්බර් මස 31 වැනි දිනට වයස අවුරුදු 18 හෝ ඊට වැඩි සියළු පුද්ගලයින් හෝ

(ii) 2024 ජනවාරි මස 01 වැනි දිනට හෝ එදිනට පසු වයස අවුරුදු 18 සම්පූර්ණ වන පුද්ගලයින් වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු

EOG 05 - 0268

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.